*සැ. යු.* - 2022.03.04 දින පළ වූ අංක 2270 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,271 - 2022 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2022.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 322 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අප්‍රේල් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

321- B 082323 — 353 (2022/03)
D 1 -

# පිස්කල් විකිණීම්

## අත්තනගල්ල දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

නඩු අංකය : 341/විශේෂ
ස්වභාවය : විශේෂ
වටිනාකම : රු. 7,00,000/-
කාර්ය පටිපාටිය : ලඝු
පිස්. අංකය : 26/20

ණය සහනදායක ආඥපනතේ 43 වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

1. සමරනායක රාජපක්ෂ මුදලිගේ චම්පිකා කුසුම්සිරි,
   අංක 77, ඕගොඩපොල,
   කහටෝවිට.

2. සමරනායක රාජපක්ෂ මුදලිගේ තිසර ජයවර්ධන,
   අංක 1/2, හුඹුටියාව,
   කහටෝවිට.

.....................*පෙත්සම්කරුවන්.*

*එදිරිව*

සුදිරික්කුගේ දර්ශන සම්පත්,
අංක 220/2, හුඹුටියාව,
නිට්ටඹුව.

........................*වගඋත්තරකරු.*

ඉහත අංක දරන නඩුව වර්ෂ 2017.06.16 වැනි දින අත්තනගල්ල දිසා විනිසුරු තැන්පත් එස්. ඒ. අයි. එස්. සුරවීර මැතිතුමා විසින් තීන්දු ප්‍රකාශ කරන ලදුව එකී තීන්දු ප්‍රකාශය පරිදි ඇති කර ගත් සමථය ප්‍රකාරව මෙම නඩුවේ වගඋත්තරකරු විසින් පෙත්සම්කරුවන් වෙත ගෙවිය යුතු සම්පූර්ණ මුදල සහ ඊට අදාළ පොළිය ද එකතුව සංශෝධිත ගාස්තු බිල්පත්‍රයේ සඳහන් මුදල වන රු. 9,28,700.53 ක මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී මුදල අය කර ගැනීම සඳහා මා වෙත නිකුත් කර ඇති ඇස්කීසි බලපත්‍රය මත මා විසින් වගඋත්තරකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති වර්ෂ 2020.10.02 වැනි දින තහනමට ගෙන ඇති නිශ්චල දේපළ වර්ෂ **2022ක් වූ අප්‍රේල් මස 08 වැනි දින ප. ව. 2.30** ට එකී නිශ්චල දේපළ සියනෑ කෝරලේ උඩුගහපත්තුවේ හුඹුටියාව ගමේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ සීමාව තුළ සියනෑ කෝරලේ උඩුගහපත්තුවේ හුඹුටියාව ගමේ පිහිටි කටහගහවත්ත නමැති ඉඩමෙන් වර්ෂ 1997ක් වූ මැයි මස 21 වැනි දින අවසරලත් මිනින්දෝරු පී. ජයකොඩි මහතා විසින් මැන සකස් කරන ලද අංක 5230 දරන පිඹුරේ ප්‍රකාරව බෙදා වෙන් කල කැබලි අංක 02 සඳහා මායිම්, උතුරට : එස්. සිරිසේනට අයිති ඉඩම හා කුඹුර ද, නැගෙනහිරට : එස්. අමරසේනට හා එස්. ජාන් සිල්වාගේ උරුමක්කරුවන්ට අයිති කුඹුර ද, දකුණට එස්. ජාන් සිල්වාගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම ද, බස්නාහිරට : කැබලි අංක 03, කැබලි අංක 04 හා කැබලි අංක 01 හා එස්. සිරිසේනට අයිති ඉඩම ද, මායිම් වූ පර්චස් දහනවයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 19.05) ක් විශාල ඉඩම සහ ඊට අයත් ගසකොළ, පළතුරු ආදී සියලු දේ සහ එකී පිඹුරේ කැබලි අංක 04 හි දක්වා ඇති මාර්ග අයිතිය ද වේ.

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
අත්තනගල්ල.

වර්ෂ 2022ක් වූ පෙබරවාරි මස 28 වැනි දින දී ය.

03-98

**අත්තනගල්ල දිසා අධිකරණයේ දී ය**

**පිස්කල් වෙන්දේසියේ විකිණීමයි**

සමරනායක රාජපක්ෂ මුදලිගේ තිසර ජයවර්ධන,
අංක 1/2, ඕගොඩපොල,
කහටෝවිට.

....................*පෙත්සම්කරු.*

නඩු අංකය : 287/විශේෂ
ඇස්කීසි අංකය : 52/20

*එදිරිව*

බී. ඒ. නීතා චන්ද්‍රකාන්ති
අංක 109/4, කහඹිලිහේන,
උඩුතුත්තිරිපිටිය.

........................*වගඋත්තරකාරිය.*

මෙම නඩුව වර්ෂ 2019.01.25 දිනැති දිසා අධිකරණයෙහි ස්ථිර කරනු ලැබූ නෛසයි තීන්දුව ප්‍රකාරව ඉහත නම සඳහන් පෙත්සම්කරු වන සමරනායක රාජපක්ෂ මුදලිගේ තිසර ජයවර්ධන යන විනිශ්චිත ණය හිමියා වෙත මෙම නඩුවේ ඉහතින් නම් සඳහන් බී. ඒ. නීතා චන්ද්‍රකාන්ති යන වගඋත්තරකාරිය විසින් ගෙවිය යුතු රුපියල් හයලක්ෂ හැත්තෑදහස (රු. 670,000/-) ක මුදල හා ඊට අදළ පොළිය ද නෛතික පොළිය ද එකතුව අනුමත නඩු ගාස්තු බිල්පත්‍රයේ සඳහන් මුදල වන රුපියල් 980,598.28ක මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී මුදල සහ ඇස්කීසි ගාස්තු ද අයකර ගැනීම සඳහා මා විසින් වර්ෂ 2020ක් වූ ඔක්තෝබර් මස 02 වැනි දින තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ **වර්ෂ 2022ක් වූ අප්‍රේල් මස 07 වැනි දින ප. ව. 2.30ට** එකී නිශ්චල දේපළ පිහිටි ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලයේ, මැද පත්තුවේ, කහඹිලිහේන ගම පිහිටි මීගහවත්ත *නොහොත්* පැලමීගහවත්ත නමැති ඉඩම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ, මැදපත්තුවේ, කහඹිලිහේන ගම පිහිටි මීගහවත්ත *නොහොත්* පැලමීගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. මාන්නප්පෙරුම විසින් නැවත මැන සකස් කරන ලද අංක 228, 2004.06.19 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 5 යනුවෙන් පෙන්වා දෙන ලද ඉඩම දැනට පවතින මායිම් අනුව මැන පෙන්වා එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 63/60 දරන පිඹුරේ කැබලි අංක 4 ද, නැගෙනහිරට : අංක 63/60 දරන දරන පිඹුරේ කබැලි අංක 6 ද, දකුණට : අංක 63/60 දරන පිඹුරේ කැබලි අංක 7 ද, සහ මාර්ගයද, බස්නාහිරට : අමාරිස් අප්පු සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද යන මෙහි තුළ රූඩ් එකයි, පර්චස් විසි එකයි දශම එකයි හය (අ. 0, රූ. 1, පර්. 21.16) ක් *හෙවත්* හෙක්ටයාර් 0.1547 ක් විශාල ඉඩමෙන් බෙද වෙන් කරන ලද අංක 5බී දරන කොටසට,

එකී එස්. මාන්නප්පෙරුම බලයලත් මානක තැනගේ අංක 526/2006 සහ 2006.06.07 දින දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 63/60 දරන පිඹුරේ කැබලි අංක 4 ද, නැගෙනහිරට : අංක 63/60 දරන දරන පිඹුරේ කැබැලි අංක 6 ද, දකුණට : මෙම පිඹුරේ 5 සී දරන කොටස ද, බස්නාහිරට : මෙම පිඹුරේ 5 ඒ දරන බිම් කොටස ද, යන මෙහි තුළ පර්චස් විසි නවයයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 29.2) ක් *හෙවත්* හෙක්ටයාර් 0.07385 ක් විශාල බිම් කොටස සහ ඊට අයිති සියලු දේ ද වේ.

ඉහත කී පිඹුරේ අඩි 8ක් පළල පාරක් සඳහා බෙද වෙන් කල අංක 5සී දරන බිම් තීරයේ පොදු මාර්ග අයිතිය ද යන මෙකී දේපළ වේ.

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
අත්තනගල්ල.

වර්ෂ 2022ක් වූ පෙබරවාරි මස 28 වැනි දින දී ය.

03-99

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.